කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය - 2017
----------------------------------------------------

කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2008 අංක 02 දරන කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 27 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව පර්යේෂණාගාර හා ඉගැන්වීම් උපකරණවලට අදාළ ඵලදායී ජීවිත කාලය වසර 5 ක් ලෙස හඳුනාගෙන තිබුණද ක්ෂය ගණනය කිරීමේදී වසර 10 ක් ලෙස සලකා සියයට 10 අනුපාතය යොදාගෙන ක්ෂය කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම රු.792,989 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැය නොකළ වෙනත් ප්‍රාග්ධනවලට අදාල රු.222,000 ක් වටිනා ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම් වැයකළ වෙනත් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට හර කිරීම වෙනුවට වැයකළ ප්‍රාග්ධන ගිණුමට හර කර තිබුණි.

(ආ) වෙනත් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.1,600,000 ක මුදලින් අයහාර වියදම් වෙනුවෙන් රු.678,000 ක් වැයකර තිබුණි.

(ඇ) ප්‍රාග්ධන ප්‍රදානවලින් දරන ලද පුනරාවර්තන ස්වරූපයේ වියදම් රු.1,235,052 ක් මූල්‍ය ප්‍රකාශනවල අයහාර වියදම් යටතේ දක්වා තිබුණද ඊට සමාන වටිනාකමක් ආදායම ලෙස හඳුනා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ඉල්ලුම් තැන්පතුවකට අදාළව 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී ආදායම රු.1,067,546 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති අගය රු.1,018,023 ක් වූයෙන් ලැබිය යුතු පොලිය රු.49,523 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළ ආයෝජන සඳහා වන පොලී ආදායම රු.3,852,691 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එම ආදායම රු.3,958,365 ක් ලෙස රු.105,674 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පරික්ෂාවේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2017 වර්ෂය තුළ ස්ථාවර තැන්පතු ආපසු ලබා ගැනීම් රු.75,324,949 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.1,537,339 ක් ලෙස ගලපා තිබීමෙන් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒම රු.73,787,610 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට අනුව වර්ෂයේ පොලී ආදායම රු.3,968,763 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.3,958,365 ක් ලෙස ගලපා තිබුණි.

(iii) ගොවීන් වෙත ණය ලබාදීම සඳහා ගොවීන්ගේ භාරකාර අරමුදලෙන් විශ්වවිද්‍යාලය වෙත ණය මුදලක් ලබා දී තිබූ අතර 2017 වසර තුළ එම ණය මුදලට අදාළව ගොවීන්ගෙන් රැස්කල රු.730,250 ක් ලැබීම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

(iv) ගොවීන්ගේ භාරකාර අරමුදලට ආයතනය ප්‍රේෂණය කළ වටිනාකම රු.1,105,000 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුදලට ගෙවූ මුදල ලෙස රු.1,041,666 ක් දක්වා තිබීමෙන් රු.63,334 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාළව 2018 වර්ෂය තුළ කරන ලද ගෙවීම් වටිනාකම රු.614,319 ක් වුවද 2017 දෙසැම්බර් 31 දිනට එම බැරකම උපචිත වියදම් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඌ) 2017 දෙසැම්බර් 31 දිනට ඉතිරි කෙසෙල් පැල තොගය 20,178 ක් වූ අතර තොග ඒකකයක පිරිවැය රු.61.89 ක් වූ බැවින් අවසන් තොගයේ වටිනාකම රු.1,248,816 ක් විය යුතුය. එසේ වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි අවසන් තොගය ලෙස රු.1,510,073 ක් දක්වා තිබීමෙන් තොග වටිනාකම රු.261,257 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.3 නොසැසඳු පාලන ගිණුම්**

------------------------

සමාලෝචිත වර්ෂයේ ලෙජර් ගිණුම් 05 ක ලෙජරය අනුව ශේෂයත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයත් අතර රු.1,209,385 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

-----------------------------

ගස්ලබු පැල අලෙවි ආදායම පරික්ෂා කිරීමේදී මාසික සාරාංශ වාර්තා අනුව ආදායම් එකතුව රු.19,435,025 ක් වූවත් මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම රු.19,367,245 ක් වූයෙන් 2017 දෙසැම්බර් 31 දිනට අලෙවි ආදායමෙහි රු.67,780 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොවීන්ගේ භාරකාර අරමුදල මඟින් ආයතනය විසින් ගොවීන් 06 දෙනෙකු වෙත ලබාදී තිබුණු රු.1,000,000 ක් වටිනා ණය මුදලින් රු.908,280 ක ශේෂයක් 2015 වර්ෂයේ සිට අය නොවී පැවති බව නිරීක්ෂණය විය.

(ආ) ග්‍රාමීය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ ආයතනය විසින් පුද්ගලයින් දෙදෙනෙකු වෙත 2012 වර්ෂයේ ලබා දී තිබුණු රු.208,000 ක ණය මුදලින් රු.35,860 ක ණය ශේෂයක් 2015 වර්ෂයේ සිට අය නොවී පැවති බව නිරීක්ෂණය විය.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

1995 ජුලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී එම විභාගය පැවැත්වූ දින සිට මාස 03 ක් ඇතුළත එහි ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවත් ආයතනය විසින් පවත්වා තිබුණු විභාග 13 ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 05 සිට මාස 10 දක්වා කාලයක් ගත කර තිබූ බව නිරීක්ෂණය විය.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.1,201,286 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.10,828,494 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,029,780 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන වලින් මිලදී ගත් ප්‍රාග්ධන වත්කම් සඳහා වන ක්‍රමක්ෂය රු.13,164,940 කින් ඉහල යාම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී වර්ධනයක හා පසුබෑමක සංකලනයක් දක්නට ලැබෙන අතර 2013 වර්ෂයේ පැවති රු.6,301,901 ක අතිරික්තය 2017 වර්ෂය වන විට රු.1,201,286 ක් දක්වා අඩු වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ක්ෂය වීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.14,477,841 ක් වූ ආයතනයේ දායකත්වය උච්චාවචනයන් සහිතව 2017 වර්ෂයේ දී රු.41,806,913 ක් වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෘෂි තාක්ෂණවේදී උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වන ශිෂ්‍ය සංඛ්‍යාව උපාධි පාඨමාලාව සම්පූර්ණ කරන ශිෂ්‍ය සංඛ්‍යාව සමග සැසඳීමේදී පාඨමාලාව සඳහා 2009 හා 2010 වර්ෂවලදී ලියාපදිංචි පළමු හා දෙවන ශිෂ්‍ය කණ්ඩායමේ සිසුන් ගණන පිළිවෙලින් 60 හා 67 ක් වුවද උපාධි පාඨමාලාව අවසන් කරනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 09 ක් හා 11 ක් විය. එනම් ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් පිළිවෙලින් සියයට 15 ක් සියයට 16 ක් වැනි අඩු ප්‍රමාණයක් උපාධිය අවසන් කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ආයතනයේ එක් එක් ශිෂ්‍ය කණ්ඩායම්වල ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවත් ඩිප්ලෝමා අදියර අවසන් කරන ශිෂ්‍ය සංඛ්‍යාවත් ප්‍රතිශතාත්මකව සංසන්දනය කිරීමේදී පසුගිය වර්ෂ 6 ක් තුළ ශිෂ්‍ය කණ්ඩායම් 6 ක ඩිප්ලෝමා අදියර අවසන් කර ඇති ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 21 සිට සියයට 56 ක අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පිළිබඳ කාර්යසාධන දර්ශක පරීක්ෂාවේදී කාර්යසාධන දර්ශක 37 කින් අටක කිසිදු ප්‍රගතියක් සිදුවී නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව අපේක්ෂිත කාර්යයන් කාර්යක්ෂමව ඉටු වී නොතිබුණි.

(ඈ) ගස්ලබු පැලවල මාසික නිෂ්පාදනය හා අලෙවිය සැසදීමේදී නිෂ්පාදනයට සාපේක්ෂව අලෙවියක් දක්නට නොවීය. ඒ අනුව මාසික නිෂ්පාදනය තුළින් වැඩි පැල ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. වර්ෂය පුරා මාසික අලෙවිය සියයට 4 සිට සියයට 62 දක්වා පහළ අගයක් ගෙන තිබුණු අතර තොග ඉතිරිය සියයට 26.4 සිට සියයට 95 දක්වා ඉහළ අගයක් ගෙන තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් ගොවීන්ගේ භාරකාර අරමුදල හා ග්‍රාමීය ව්‍යවසාය වැඩසටහන යටතේ ණය වැඩසටහන් දෙකක් පවත්වා ගෙන යන අතර එම ණය මුදල් ප්‍රදානය කිරීමේදී ගොවීන් හා භාරකාර අරමුදල අතර විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. එම ණය මුදල් නැවත අයකර ගැනීමේ නිශ්චිත වූ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් ලබා දෙන ණය අයකර ගැනීම සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් පැන නැගී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2014 දෙසැම්බර් 26 දින ආයෝජනය කර තිබූ රු.10,120,895 ක් වටිනා ඉල්ලුම් තැන්පතුව 2018 සැප්තැම්බර් 21 විගණිත දිනය දක්වාම එසේ පැවති අතර ආයෝජනය කළ දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු ආයෝජන ආදායම රු.1,067,546 ක් විය. මෙම මුදල ස්ථාවර තැන්පතුවක ආයෝජනය කළේ නම් දළ වශයෙන් ලබාගත හැකිව තිබුණු පොලී ආදායම රු.2,159,874 කි. ඒ අනුව ආයතනයට ආසන්න වශයෙන් රු.1,092,328 ක ආදායමක් අහිමි වී තිබුණු බව නිරීක්ෂණය කෙරේ.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 26 ක් වන අතර තත්‍ය කාර්ය මණ්ඩලය නිලධාරීන් 08 ක් විය. ඒ අනුව සමස්ත කාර්ය මණ්ඩල ඌනතාවය 18 ක් වන අතර ඒ තුල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු, කථිකාචාර්යවරුන් දෙදෙනෙකු හා තාවකාලික ශිල්ප ප්‍රදර්ශක (Temporary Demonstrators) එක් තනතුරක ඌනතාවයක් පැවතුණි.

(ආ) 2017 වර්ෂයේදී ආයතනය විසින් කාර්ය පැවරුම් පදනම මත සේවකයන් 55 දෙනෙකු සේවයේ යොදාගෙන තිබූ අතර එම සේවකයින් වසර 01 සිට වසර 18 ක් ආයතනයට සේවය කර තිබූ බව නිරීක්ෂණය විය. මේ සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගෙන තිබුණද කාර්ය මණ්ඩල අවශ්‍යතාවය සංශෝධනයකින් තොරව කාර්ය මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 41 ක් සේවයේ යොදවා තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නේවාසිකාගාර 60 ව්‍යාපෘතිය යටතේ රු.220,096,952 ක් වැයකර 2014 වර්ෂයේදී කාමර 100 කින් සමන්විත සිසුන් 400 කට නවාතැන් ගතහැකි නේවාසිකාගාරයක් ආයතනය තුළ ඉදිකර තිබූ අතර එය 2014 වර්ෂයේදී ආයතනයට පවරා තිබුණි. 2017 වර්ෂයේ එක් එක් මාසය තුළ කාමර භාවිතය පරීක්ෂාවේදී භාවිතයට ගෙන තිබුණු උපරිම කාමර ගණන 32 ක් විය. දිනකට උපරිම වශයෙන් නේවාසිකව සිටි සිසුන් ගණන 77 ක් වූ අතර සිසුන් අඛණ්ඩව නේවාසිකව නොසිටින බව නිරීක්ෂණය විය. 2018 සැප්තැම්බර් 28 විගණිත දිනය වන විටත් මෙම නේවාසිකාගාරය උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව භාවිතයට ගැනීමට ආයතනයට නොහැකි වී තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 6.1 ප්‍රසම්පාදනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණද ඒ සඳහා ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ කළ යුතු දින වකවානු ඇතුළත් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. ඒ අනුව ප්‍රසම්පාදනයන් නිශ්චිතව හඳුනාගත නොහැකි වූ අතර සැලැස්ම සමග සැසඳීමට නොහැකි වීම සහ කාලසටහන ඇතුළත සම්පූර්ණ කර තිබූ බව විගණනයට තහවුරු කරගත නොහැකි විය.

(ආ) නියැදි පරීක්ෂාවේදී වටිනාකම රු.638,250 ක් වූ දේශන ශාලා සඳහා පුටු 75 ක් මිලදී ගැනීම අදාළ අංශයෙන් භාණ්ඩ ඉල්ලුම් කළ දිනයේ සිට සැපයුම්කරුගෙන් භාණ්ඩ ඇණවුම් කිරීම දක්වා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දින 125 ක කාලයක් ගත වී තිබුණු අතර රු.58,300 ක් වටිනා මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීමේදී ද මෙම ක්‍රියාවලිය සඳහා දින 202 ක පමණ කාලයක් ගතවී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු වල ප්‍රමාදයන් පැවති බව නිරීක්ෂණය විය.

## 6.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය හා තත්‍ය ආදායම් හා වියදම් සැසඳීමේදී අභ්‍යන්තරව ඉපයූ ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 81.9 කින් අඩු වී තිබූ අතර වියදම් විෂයයන් 06 ක අයවැය ගත ප්‍රතිපාදනය ඉක්මවා සියයට 44 සිට සියයට 433 දක්වා වැය කර තිබූ බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| | --------------------------------- | ------------ |
| (අ) | පැල නිෂ්පාදනය සහ අලෙවිය | අලෙවිය පිළිබඳව පුරෝකථනය සිදුකර පැල නිෂ්පාදනය නොකිරීම, නිෂ්පාදනයන් සහ අලෙවිය සැලසුම් කර නොතිබීම, අනෙකුත් නිෂ්පාදනයන් සඳහා නිෂ්පාදන ගිණුම් සකස් නොකිරීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | (i) කාර්ය මණ්ඩල අවශ්‍යතා අනුව අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය කර නොගැනීම සහ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| | | (ii) ආයතන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නිවැරදි තොරතුරු ඇතුලත් කර පවත්වා නොගැනීම |
| (ඇ) | තොග අගය කිරීම | පැල තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය අනුව තොග අගය නොකිරීම. |
| (ඈ) | ණය පාලනය | ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |